# ලාංකික ථෙරවාද සම්ප්‍රදාය පෝෂණය කිරීමෙහි ලා පාලි බණ කථා සාහිත්‍යයේ දායකත්වය

පූජ්‍ය උඩුහාවර ආනන්ද හිමි

ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය අධ්‍යයනයෙහි ලා අභිධර්මය, **පාලි අට්ඨකථා** හා **විසුද්ධිමග්ග** යන ප්‍රධාන මූලාශ්‍රය භාවිත කෙරෙන අතර එයින් පරිබාහිර ව පවතින පාලි වංශකථා පාලි සංග්‍රහ ග්‍රන්ථවල උපයෝගීතාව ද සුළු කොට සැලකිය නො හැකි ය. විශේෂයෙන් ම ලාංකික ථෙරවාද සම්ප්‍රදායේ පශ්චාත් කාලීන වර්ධනය හා සම්බන්ධ සංකල්ප අධ්‍යයනයේ දී මෙම පාලි මූලාශ්‍රය බෙහෙවින් වැදගත් වේ. අනෙක් අතට මෙම මූලාශ්‍රය සම්භාව්‍ය සිංහල සාහිත්‍යය කෙරෙහි ද දැඩි බලපෑමක් සිදු කර ඇත. එයින් **ධම්මපදට්ඨකථාව** හා **ජාතකට්ඨකථාව** ප්‍රධාන මූලාශ්‍රය වේ. එම ග්‍රන්ථ ද්වය හැර පාලි බණ කථා සාහිත්‍යයට අන්තර්ග්‍රහණය කළ හැකි ග්‍රන්ථ රැසක් ලංකා පාලි සාහිත්‍යයේ විද්‍යමාන වේ. ඒ යටතේ **සීහළවත්ථුප්පකරණ, සහස්සවත්ථුප්පකරණ, සාරසංගහ, රසවාහිනී, සොතබ්බමාලිනී, සාධුචරිතොදය සද්ධම්මසංගහ** යන කෘති ප්‍රධාන වේ.

පාලි බණ කථා සාහිත්‍යයේ විශේෂත්වය හා එහි අන්තර්ගත කථා මගින් ඉදිරිපත් කෙරෙන සංකල්ප ලාංකික ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායේ පශ්චාත් වර්ධනය කෙරෙහි කෙසේ ඉවහල් වී දැයි **සීහළවත්ථුප්පකරණය** හා **සහස්සවත්ථුප්පකරණ** යන මූලාශ්‍රය ආශ්‍රයෙන් විමර්ශනය කිරීම මෙම ලිපියේ මූලික අභිප්‍රාය වේ. මෙහි දී අපගේ අවධානය යොමුවන්නේ තත් ග්‍රන්ථයන්හි ඓතිහාසිකත්වය භාෂාමය හා සාහිත්‍යික වැදගත්කම අවධාරණය කිරීම වෙනුවට ග්‍රන්ථාගත කථා මගින් ඉදිරිපත් කෙරෙන සංකල්ප ලාංකික ථෙරවාද බෞද්ධ සංස්කෘතිය පෝෂණය කිරීමෙහි ලා කොතෙක් දුරට උපස්ථම්භක වී ද යන්න විමර්ශනය කිරීම ය.

## පාලි බණ කථා සාහිත්‍යය

පාලි බණ කථා සාහිත්‍යය යනුවෙන් හැඳින්වෙන සාහිත්‍යාංගය අතිශය පුළුල් එකකි. පාලි අට්ඨකථාවල මෙන් ම ටීකාවලත් විවිධ වර්ගයේ බණ කථා ඇතුළත් වුව ද ඒ සියල්ල  නොයෙක් ධර්ම කරුණු තහවුරු කිරීම පිණිස ඉදිරිපත් කරන ලද ඒවා මිස කථා සමුච්චයක් හෝ එකතුවක් ලෙස සංග්‍රහ කොට නොමැත. අටුවාවල එන ඇතැම් බණ කථා පිටක ග්‍රන්ථවලින් උපුටාගෙන ඇති අතර සමහර

බණ කථා අට්ඨකථා සාහිත්‍යයට ම ආවේණික බවක් විද්‍යමාන වේ. මෙම අට්ඨකථා හා ටීකා ග්‍රන්ථවල විද්‍යමාන පාලි බණ කථා හැර වෙන ම රචනා වූ පාලි බණ කථා ග්‍රන්ථ රැසක් පාලි සාහිත්‍යයට අයත් ව තිබේ. එයින් **සීහළවත්ථුප්පකරණ, සහස්සවත්ථුප්පකරණ, සාරසංගහ, රසවාහිනී, සොතබ්බමාලිනී, සාධුචරිතොදය සද්ධම්මසංගහ** යන කෘති විශේෂ වේ.

විවිධ මාතෘකා ඔස්සේ ලිය වී ඇති මෙම බණ කථා අතුරෙන් ඇතැම් බණ කථා යථෝක්ත කෘතිවල සමාන ව හා වෙනස්කම් සහිත ව දක්නට ලැබේ. භාරතීය හා ලක්දිව බණ කථා වෙන් කොට දක්වා තිබීම තවත් විශේෂයකි. බෞද්ධ තේමාවක් රැගත් මෙම බණ කථා ලිවීමේ මුඛ්‍යතම අරමුණ වී තිබෙන්නේ සමාජ සදාචාරය ගොඩනැඟීම ය. ගද්‍යය හා පද්‍යය යන දෙකින් ම සම්මිශ්‍රිත පාලි බණ කථා ග්‍රන්ථවල භාෂාව ඉතාමත් සරල ය. පිටක හා අටුවා ග්‍රන්ථවල දැක්වෙන ආකාරයේ උසස් භාෂා ලක්ෂණ මෙම ග්‍රන්ථවල විද්‍යමාන නො වේ. පොදු ජනයා අරමුණු කරගෙන රචිත හෙයින් එසේ වන්නට ඇතැ'යි උපකල්පනය කළ හැකි ය. කෙසේ නමුත් එම ග්‍රන්ථ පරිශීලනය කිරීමේ දී විද්‍යමාන වන කාරණය වන්නේ ඒවා සිංහල සම්භාව්‍ය සාහිත්‍යය පෝෂණය කරමින් එහි වැඩී යාමට අවශ්‍යය මූලික පදනම දැමූ බව ය. පාලි භාෂාව ජනප්‍රිය ව පැවැති අවදියේ පොදුජන චින්තනය සකස් කිරීමේ අරමුණින් රචිත මෙම පාලි බණ කථා පසු කලෙක සම්භාව්‍ය සිංහල ග්‍රන්ථ රචකයන් විසින් බෙහෙවින් භාවිතයට ගෙන තිබේ. සිංහල භාෂාවට පරිවර්තිත මෙම බණ කථා ක්‍රමයෙන් පොදු ජනයා අතර බෙහෙවින් ජනප්‍රිය වීම හේතුවෙන් පාලි බණ කථා භාවිතයෙන් ඈත් ව තිබේ. එම බණ කථා බහුල වශයෙන් භාවිතයට ගෙන ඇත්තේ පාලි භාෂාව උගත් ධර්ම දේශකයන් විසින් පමණි.

## පාලි බණ කථා සාහිත්‍ය ලිවීමේ අරමුණ

පාලි බණ කථා සාහිත්‍ය ලිවීමේ මූලික අරමුණ වී ඇත්තේ සමාජ සදාචාරය ගොඩනැඟීම ය. බුදුසමයේ එන සාදාචරය හා සම්බන්ධ පින් පව් හොඳ නරක පෙන්වා දී ශ්‍රාවකයා පවින් වැළක්වීමත් යහපතෙහි යෙදවීමත් මෙම බණ කථා මගින් අවධාරිත ය. බෞද්ධ කර්මය පිළිබඳ පශ්චාත් කාලීන ඉගැන්වීමක් වන "කම්ම සරික්කතා" සංකල්පය ඉස්මතුකර පෙන්වීමට දරන ලද ප්‍රයත්නය පාලි බණ කථාවලින් ප්‍රකට වේ. මෙම බණකථාවල බුදුසමයේ එන දාර්ශනික ඉගැන්වීම් අන්තර්ගත නො වන්නේ ඒවා සැබැවින් ම සාමාන්‍ය ජනයා අරමුණුකොට රචනා වී ඇති නිසා විය හැකි ය. එහෙත් එහි මිනිස් සිතෙහි ස්වභාවය හා එහි ක්‍රියාකාරීත්වය විවරණය කෙරෙන අවස්ථා සුලබ ව දැකිය හැකි ය. ගිහි ජනයා අරමුණු කරගත් මෙම බණ කථා මගින් දානය, ශීලය, උපෝසථ සමාදානය යනාදි යහපත් ක්‍රියා අනුගමනය කිරීමෙන් මෙලොව හා පරලොව වශයෙන් ලැබෙන ප්‍රතිලාභ විස්තර කෙරේ. භාවනාව යටතේ එන සමථය හෝ විපස්සනාව ප්‍රගුණ කිරීමෙහි ලා ගිහියන් උනන්දු කරවීමක් පාලි බණ කථා මගින් සිදු වී නොමැත. මුල් බුදුසමයෙන් හඳුන්වා දෙන ලද ගිහි ප්‍රතිපදාව ඒ අකාරයෙන් ම පාලි බණ කථා සාහිත්‍යයෙන් ද පිළිගෙන ඇති බව සදාචාරාත්මක ක්‍රියා වශයෙන් පුණ්‍ය ක්‍රියා පමණක් නිර්දේශ

කිරීමෙන් පැහැදිලි වේ. ගිහියාගේ ප්‍රමුඛතම කාර්ය වී ඇත්තේ ගිහි ජීවිතයට අදාළ කාර්ය කටයුතුවල නිරතවෙමින් පින් රැස් කිරීම ය. ඔවුන් කඩිනමින් නිවන සඳහා මෙහෙයවන ඉගැන්වීමක් පාලි බණකථාවලින් ප්‍රකට නො වේ. පාලි බණ කථාවල අන්තර්ගතය අනුව දානය හා එහි ආනිසංස විවිධ නයින් ගෙනහැර දැක්වීම එහි ප්‍රමුඛතම කාර්ය වේ. එයට අමතර ව බණ ඇසීම, එයට අනුග්‍රහ දැක්වීම, දෙමාපියන්ට සැලකීම, මෙත් වැඩීම, ක්‍රෝධ නො කිරීම, පින් අනුමොදන් කිරීම, සතුන්ට අභයදානය දීම, සංඝෝපස්ථානය, පුදපූජා ආදි ආගමික පිළිවෙත්වල නිරතවීම සදාචාරාත්මක ක්‍රියා නිර්දේශිත ය. සාංඝික දේපළ සොරකම් කිරීමෙන් ප්‍රේතයන් ව උපදින බව ඇතැම් බණ කථාවලින් නිරූපිත ය. **සීහළවත්ථුප්පකරණයේ** එන පාසාණපේතවත්ථුවෙහි කාශ්‍යප බුදුන් සමයෙහි සඟසතු කෙතකින් ගත් ධාන්‍ය අනුභව කිරීමේ විපාක වශයෙන් ගල් ප්‍රේතයෙකු බවට පත් ව තිබේ.[1] එහි දැක්වෙන ථම්භ පේත කථාවෙන් පෙන්වා දෙන්නේ සංඝික කුඹුරක මායිම් වෙනස්කොට තම කුඹුර පුළුල් කරගැනීම නිසා එක් අයෙකු ප්‍රේතයකු වූ බව යි. **පේතවත්ථුපාලියේ** නොමැති පේතකථා අටක් **සීහළවත්ථුවෙහි** ඇතුළත් වන අතර ඒ සියල්ල ම සාංඝික දේපළ පරිහරණයේ ආදීනව පැහැදිලි කිරීම උදෙසා රචනා වී තිබේ. මෙම පේත කථා මගින් ඉදිරිපත් කරන ලද අදහස් පොදු ජනයා තුළ තදින් ම මුල්බැසගෙන තිබෙන හෙයින් සඟ සතු දෑ පරිහරණයෙහි ලා ඔවුහු මහත් බියක් දක්වති. එම විශ්වාසය අනුව ආරාමික දේපළ ආරක්ෂා වී යැයි උපකල්පනය කළ හැකි ය. අනෙක් අතට එය ලාංකික ථෙරවාද බණ කථා රචකයන් විසින් ආරාමික දේපළ ආරක්ෂා කරගැනීමෙහි ලා දරන ලද ප්‍රයත්නයක් සේ සැලකිය හැකි ය.

පාලි බණ කථා අතුරින් ඇතැම් ඒවා භාරතීය කථා වස්තු වන අතර බොහෝ කථාවස්තු ලක්දිව සිදුවීම් හා සැබැඳි ඒවා වේ. ලක්දිව රාජ්‍ය කළ දුටුගැමුණු හා රජ පවුල පිළිබඳ ලියවුණ බණ කථා රැසක් දක්නට ලැබේ. ඒ අනුව **සීහළවත්ථුප්පකරණයෙහි** එම රජ පවුල හා සම්බන්ධ බණ කථා හයකි. **සහස්සවත්ථුප්පකරණයෙහි** කථා දහයකි. රට එක්සේසත් කළැ'යි සැලකෙන දුටුගැමුණු රජු සිංහල බෞද්ධයන්ගේ පරමාදර්ශී පාලකයා වේ. එ බැවින් ඔහු හා ඔහුගේ පවුලේ සමාජිකයන් හා බැඳුණු පුවත් ඇසීමට සිංහල බෞද්ධයන් ආකර්ෂණය වීම ස්වාභාවික ය. සිංහල බෞද්ධ සමාජය මහත් සේ ඇලුම් කරන රාජ්‍ය පාලකයාගේ ගුණ ඇතුළත් බණ කථා සමූහයකන් නිර්මාණය වී තිබෙන්නේ එම පසුබිම අනුව ය.

ලාංකික ථෙරවාද සම්ප්‍රදායේ ආගමික පූජාවිධි නිර්මාණය වීමෙහි ලා පාලි බණ කථා සාහිත්‍යය මගින් හඳුන්වාදෙන ලද නව සංකල්ප බෙහෙවින් උපස්ථම්භක වී ඇත. ප්‍රධාන ආගමික සංකේත වන ස්තූපය[2] හා බෝධි වෘක්ෂය හා සැබැඳි ආගමික චාරිත්‍ර විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ ඒවා වර්ධනය වීමට හේතු වූ වස්තු බීජ පාලි බණකථා සාහිත්‍යයේ වැඩි වශයෙන් අන්තර්ගත ව පවතින බව යි. එසේ ම කෙනෙකු මරණාසන්න අවස්ථාවට පත් වූ පසු ව ඔහු වෙනුවෙන් පින්කම් කිරීම බෞද්ධ චාරිත්‍රයකි. මෙහි දී එක් භික්ෂුවක හෝ භික්ෂූන් කීප නමක් ගෙන්වාගෙන

සපිරිකර සංඝ ගත දක්ෂිණාවක් පිරිනමා බණක් කියවීම සිදු වේ. එසේ කරනු ලබන ධර්ම දේශනය පංචස්කන්ධය පිළිබඳ විග්‍රහයකින් යුක්ත වේ.[3] පසු කලෙක ආසන්න බණ යනුවෙන් ව්‍යවහාරයට පැමිණ ඇත්තේ එම චාරිත්‍රය යි.

බෞද්ධ පොදු ජන ආගමික චින්තනය හා සම්බන්ධ විශ්වාස පද්ධතිය අධ්‍යයනය කිරීමේ දී පාලි බණ කථා සාහිත්‍ය බෙහෙවින් උපනිශ්‍රය වේ. කෙනෙකු දිළිඳු ව ඉපදී ඇත්තේ පෙර ආත්මයේ දන් නො දීම යන විශ්වාසය බොහෝ පාලි බණ කථාවල දක්නට ලැබෙන්නකි. මෙ නිසා තම ජීවිතය පවා පරදුවට තබා දන් දුන් පුද්ගලයක් පිළිබඳ කථා පුවත් රැසක් බණ කථා සාහිත්‍යයේ අන්තර්ගත ව තිබේ. ඇතැම් අවස්ථාවල දී තම ඇඳිවත ගළවා පිරිසිදු කොට, එය භික්ෂූන් උදෙසා පූජා කොට කොළ අතුවලින් විලි වසා ගත් පුවත් ද, බැළමෙහෙවරෙහි යෙදී උපයාගත් ධනය වැයකොට දන් පූජා කළ පුවත් ද දක්නට ලැබේ. ඇතැම් කාන්තාවන් තම සුන්දර කෙස් වැටිය කපා එය මිලකොට දන් පිරිනමා ඇත. දානය උදෙසා පූජා කිරීමට අවශ්‍යය කිසිවක් නො වූ අවස්ථාවල දී තම ශරීර මාංශය ඒ වෙනුවෙන් පූජා කරන්නට පෙලඹුණ ස්ත්‍රී පුරුෂයන් පිළිබඳ පුවත් ඇතුළත් බණ කථා ද දක්නට ලැබේ. ස්ත්‍රීත්වය පුරාකෘත අකුශල කර්මයක විපාකයක් ය යන විශ්වාසය පාලි බණ කථාවල දක්නට ලැබෙන තවත් අදහසකි. මෙ නිසා ඇතැම් කාන්තාවන් දන් පිරිනමා මතු ආත්මයේ පිරිමි බව ප්‍රර්ථනා කර ඇත.[4]

පාලි බණ කථාවල එන භික්ෂූන් අතුරින් බහුතරයක් භික්ෂූන් වහන්සේ විදර්ශනා භාවනාව වැඩූ, පිණ්ඩපාතයෙන් යැපුණ, වනසෙනසුන් හා ගල්ලෙන්හි වාසය කළ දිවි පරදුවට තබා සිල් ගුණ පුහුණු කළ අය වූහ. එක්තරා භික්ෂුණියක් දිය නෑමට ගොස් කිඹුලෙකු ඩැහැගත් කල්හී පුරුෂයෙකු ඇය බේරාගැනීමට ඉදිරිපත් වූ විට තම ශීලයට බාධා වෙතැයි එයට අකමැති වූවා ය.[5] තම ආචාර්ය උපාධ්‍යයන් කෙරෙහි මහත් බැඳීමකින් කටයුතු කළ ශිෂ්‍ය භික්ෂූන් ද සිටි බව පෙනේ.[6] එහෙත් ඇතැම් භික්ෂූන්වහන්සේ දුසිල්වත් අය වූහ. එසේ වුව ද සමස්ත බණ කථා සාහිත්‍යයෙන් වැඩිමණක් ම අවධාරණය කෙරෙන්නේ දානය හා තදායත්ත අනුරූපි විපාක පිළිබඳ ව ය. බොහෝ බණ කථාවල දානයේ අනුරූපි විපාක ආශ්චර්ය අද්භූත ජනක සිදුවීම් සහිත අධියථාර්ථවාදී ස්වරූපයකින් ඉදිරිපත් කොට තිබේ.

## සීහලවත්ථුප්පකරණය

අග්ගමහ පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ගේ අප්‍රතිහත ධෛර්යයේ ප්‍රතිඵලයක් වශයෙන් පාලි **සීහලවත්ථුප්පකරණය** සංස්කරණය කොට මුද්‍රණය කරන ලද අතර, පසු කලෙක උන් වහන්සේ විසින් "**ඉතා පැරණි සිංහල බණ කථා**'' යනුවෙන් එයට අගනා සිංහල අනුවාදයක් ද සපයා තිබේ.[7] මෙහි කතුවරයා දකුණු ඉන්දියාවේ කණ්ටකසෝලපට්ටනේ පට්ටකොට්ටිවිහාර වාසී ආචර්ය ධම්මදින්න තෙරුන්වහන්සේ ය. අග්ගමහ පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ පිළිගැනීම අනුව මෙම කෘතිය පාලි අට්ඨකථා රචනා වීමටත් පෙර සම්පාදනය වූ පැරණි ග්‍රන්ථයකි. මේ සම්බන්ධයෙන් මහාචාර්ය පරණවිතානයන්ගේ

මතය උපුටා දක්වන බුද්ධදත්ත හිමියෝ, මෙහි කතුවරයා නිසැක ව ම දකුණු ඉන්දියාවේ ආන්ධ්‍ර දේශයේ විසූ අයෙකු යැ'යි නිගමනය කරති.

**සීහළවත්ථු, සහස්සවත්ථු** හා **රසවාහිනී** යන කෘති තුන අතුරින් පළමු වැන්න වඩාත් පැරණි වන අතර, එය දකුණු ඉන්දියාවේ දී සම්පාදිත ය. **සහස්සවත්ථුව** හා **රසවාහිනී** යන කෘති දෙක එයට පසු ව ලක්දිව දී රචනා වී තිබේ. **සීහළවත්ථුවේ** කථා අසූ දෙකක් ඇතුළත් වේ. එයින් කථා වස්තු හයක් **සහස්සවත්ථුවේ** ද දක්නට ලැබේ. ඒ අනුව මෙම ග්‍රන්ථ දෙකෙහි පවතින අන්තර් සම්බන්ධය ප්‍රකට වේ. වෙනත් ග්‍රන්ථයක දක්නට නො ලැබෙන කථාවස්තු රැසක් **සීහළවත්ථුවේ** අන්තර්ගත වේ. ඒ අතුරින් මෙත් බෝසතුන් පිළිබඳ කථාව විශේෂිත වූවකි. ලක්දිව රුහුණු ජනපදයෙහි විසූ මලය නම් තෙරුන් වහන්සේ තමන් වහන්සේට ලැබුණු උපුල් මල් මිටි අටක් සිළුමිණි සෑයට පූජා කිරීම සඳහා තව්තිසා දෙව්ලොවට වැඩම කළ අවස්ථාවෙහි එහි වෙසෙන මෙත් බෝසතුන් මෙන් ම සද්ධාතිස්ස හා දුටුගැමුණු දෙබෑ රජවරුන් ද ඔහු පිරිවරා සිටින අයුරු දුටහ. මලය තෙරුන් දුටු මෙත් බෝසතුන් උන් වහන්සේ වෙත පැමිණ නමස්කාර කොට කොහි සිට පැමිණියේදැ'යි විමසී ය. තමන් වහන්සේ ජම්බුද්වීපයේ සිට පැමිණි බවත් අනාගතයේ මෛත්‍රීය බුදුන් දැකීම දඹදිව් වැසියන්ගේ ප්‍රාර්ථනය බවත් දැන්වී ය. ඔවුන්ගේ ප්‍රාර්ථනා සමෘද්ධිමත් කරමින් අනාගතයේ බුද්ධත්වයට පත් වන බව මෙත් බෝසතාණන් වහන්සේ ප්‍රකාශ කළහ. **සීහළ වත්ථුවේ** එන මෙම කථා පුවත මෛත්‍රීය බුද්ධ සංකල්පය පිළිබඳ ලාංකික ථෙරවාද විශ්වාසය තහවුරු වීමෙහි ලා හේතු වී වූ බව පෙනේ. සිංහල බෞද්ධ ජනයාගේ අසහාය වීරයා වන දුටු ගැමුණු දෙබෑ සොහොයුරන් මෙත් බුදුන්ගේ අග්‍රශ්‍රාවයකයන් වන බවක් **අනාගතවංශයේ** නො දැක් වේ.[8] එහෙත් **සීහළවත්ථුව** ඉදිරිපත් කරන මෙම පුවත එහි ආරම්භය සනිටුහන් කෙරෙන බව පැහැදිලි ය.

**සීහළවත්ථු** බණ කථාවල අන්තර්ගතය වීමසීමෙන් ලාංකික ථෙරවාද සම්ප්‍රදායේ පශ්චාත් කලීන වර්ධනයන් හඳුනාගත හැකි ය. මුල් බුදු සමයේ එන පුඤ්ඤ සංකල්පය ප්‍රවර්ධනය කිරීම මෙම බණ කථාවල ප්‍රධාන ලක්ෂණය යි. **සීහළවත්ථුවේ** එන සැම බණ කථාවකින් ම "කම්මසරික්කතා" සංකල්පය ඉස්මතුකොට ඇත. පොදුවේ සැම බණ කථාවක ම මුඛ්‍යතම තේමාව බවට පත් ව තිබෙන්නේ දානය හා ඊට අනුරූප ආනිසංස අතිශයෝක්තියෙන් වර්ණනා කිරීම ය. දන් දීම සඳහා ඇතැම් පුද්ගලයන් විසින් දරන ලද ප්‍රයත්නය විස්මය ජනක ය. තම හිසකෙස් කපා දන් දුන් සුමනාවගේ කථාවත් හිස මත තැබූ ආධාරකයක් තබා බත් පිස දන් දුන් කුලදුවගේ කථාව එයට නිදසුන් කොට දැක්විය හැකි ය. දානය මිනිසුන්ට පමණක් නො ව තිරිසන්ගත සතුන්ට ද පිරිනමා තිබේ (මිත්ත ථෙර වත්ථු) දන් දීම, මෙත් වැඩීම (ඵුස්සදේව වස්තුව), බණ අසා සාධුකාර දීම (සාලිකුමාර වස්තුව), පත්තිදාන (මහාදේව වස්තුව හා දුග්ගතකස්සක වත්ථු), පරදාර සේවනයෙන් වැළකීම (පරදාර විරත වත්ථු) සඟ සතු දෑ විනාශ කිරීම (පාසාණ, ථම්භ, කසි, තණ්ඩුල, භත්තන්තරාවකරපෙත, පතාකපෙත, සංඝසන්තකපමත්තපෙත ප්‍රේත), දුශ්ශීල වීමේ ආදීන ව (තරුණ භික්ෂු වස්තුව), වස්තු තණ්හාවේ ස්වභාවය (ලොහභාජන වත්ථුව),

අභය දානය (බද්ධහත්ථිනාග වත්‍ථු), පින් රැස් කිරීමේ අගය (මක්කටී වත්‍ථු), ස්තූප පූජාවේ අගය (මහචේතිය පූජා කථා, බුද්දක තිස්ස කථා), කාමයෙහි ආදීනව හා ආධ්‍යාත්මික විමුක්තියේ වටිනාකම (විබ්භන්තකචොර වත්‍ථු), අධාර්මික පාලනය (ධම්මිකරාජ) ආදි විවිධ තේමාවන් යටතේ කරුණු ඉදිරිපත් කෙරෙන හෙයින් සමාජ සදාචාරය ගොඩ නැගීමෙහි ලා මෙම කථා වස්තු මූලාශ්‍රය කොට ගත හැකි ය.

**සීහළවත්ථුවේ** එන ඇතැම් කථා වස්තු විස්මය ජනක ය. විසි දෙවන ලෝහ භාජන වස්තුවෙහි ගිහි කල ලෝහ භාජනයකට ඇළුම් කළ සොරෙකු පැවිදි ව පසු ව රහත් වීමෙන් අනතුරු වත් එම ලෝහ භාජනයට පුද සත්කාර කළේ ය. රහත් වීමෙන් පසුවත් ලෝහ භාජනය කෙරෙහි වූ ආශාව ඉවත් ව නො ගිය බව මෙම කථාවෙන් ගම්‍ය වේ. රහතන් වහන්සේ වනාහි සියලු කෙලෙස් ධර්ම ප්‍රහීණ කළ අයෙකි. එබඳු උතුමෙකුගේ මෙබඳු හැරීමක් අපේක්ෂා කළ නො හැකි ය.

ඇතැම් භික්ෂූන්වහන්සේ ලා ජීවිත පරිත්‍යාගයෙන් ශීලය ආරක්ෂා කළ බව ලජ්ජී සමාණේර කථාව, චිත්තගුත්ත තෙරුන්ගේ කථාව හා අම්බඛාදක තිස්ස තෙරුන්ගේ කථාව ආදි බණ කථාවලින් සනාථ වේ. භික්ෂූන් පමණක් නො ව භික්ෂුණීන් ද ජීවිත පරිත්‍යාගයෙන් ශික්ෂා පද ආරක්ෂා කළ බව හැට පස් වන තරුණ භික්ෂුණීන් දෙපළගේ කථාවෙන් සනාථ වේ.

### සහස්සවත්‍ථුප්පකරණ

ගුත්තවංක පිරිවෙන් වැසි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් විසින් රචිත **සහස්සවත්ථුව** පාලි බණ කථා සාහිත්‍යයට අයත් තවත් ග්‍රන්ථයකි. ග්‍රන්ථ නාමය අනුව **සහස්සවත්‍ථු** යන්නෙන් සතුට (සහර්ෂ) උපදවන කථා යන අදහස ගම්‍ය වේ. කථා වස්තු අනූ පහකින් සමන්විත **සහස්සවත්‍ථුවේ** භාෂාව දුර්වල ය. කථාවස්තු වර්ගීකරණය ද අවිධිමත් ය. ලාංකිකයන්ට පාලියෙන් ලිවීමට නො හැකි වූ අවදියක මෙය රචනා කරන්නට ඇතැ'යි පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියෝ සඳහන් කරති.[9] පැරණි බණ කථාවල අන්තර්ගත දෝෂ බැහැර කොට එම කථාවස්තු විධිමත් ආකෘතියකට අනුව වර්ගීකරණය කරමින් **රසවාහිනිය** සම්පාදිත බව එහි ආරම්භක වත්ථුගාථාවල සඳහන් වේ.[10] ඒ අනුව වේදේහ හිමියන් විසින් සම්පාදිත **රසවාහිනිය** බෙහෙවින් ජනප්‍රිය වූ අතර **සහස්සවත්‍ථු** භාවිතයෙන් බැහැර විය.

කථා අනූපහකින් සමන්විත **සහස්සවත්‍ථුවේ** අන්තර්ගත කථාවස්තුවල මුඛ්‍යතම අරමුණ වී ඇත්තේ සෙසු පාලි බණ කථා මෙන් ම පොදුජනයාගේ ආගමික විශ්වාස පද්ධතිය තහවුරු කිරීම මෙන් ම සමාජ සදාචාරය ගොඩ නැගීම ය. ඒ යටතේ ආරම්භක කථා වස්තු හතර ධර්මය ශ්‍රවණය කිරීමේ අගය පැහැදිලි කරන අතර, ඒ අතුරින් දහම්සොඬ කථාවස්තුව බෙහෙවින් ජනප්‍රිය එකකි. ධර්ම කථිකයන් විසින් සිය ධර්ම දේශනා පූර්විකාවේ මෙම කථාව නිතර උපුටා දක්වමින් බණ ඇසීමට ජනයා උනන්දු කරවනු ලැබේ. ථෙරවාද බණ පූජා චාරිත්‍රය වර්ධනයෙහි ලා එහි දායකත්වය කැපී පෙනේ.

මෙයට අමතර ව කළ ගුණ සැලකීම (අවාටතො නීහටවත්ථු), විවාහයට වඩා ආගමික ජීවිතය උසස්කොට සැලකීම (බුද්ධෙනියා), සොරකම් කිරීමේ ආදීනව (ආරඤ්ඤක අභයත්‍ථෙර), පොදු ජන ආගමික විශ්වාසය වන "නමෝ බුද්ධාය" යන්න ආරක්‍ෂක මන්ත්‍රයක් ලෙස භාවිත කිරීම (මිච්ඡාදිට්ඨික වත්ථු) තිසරණයෙහි පිහිටා කටයුතු කිරීමේ අගය (සරණත්‍ථෙර වත්ථු) බෞද්ධ ස්තූප විනාශ කිරීමේ ආදීනව (සිරිනාග වත්ථු), දන් දීම හා ස්තූප ප්‍රතිසංස්කරණය කිරීමේ අගය (සද්ධාතිස්ස වත්ථු), ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාව හා ථෙරවාද බුදුසමයේ පශ්චාත් කාලීන චාරිත්‍රයක් වන පත්ති දාන සංකල්පය (සමණගාමපබ්බතවත්ථු/නකුලස්සවත්ථු) විවරණය කෙරේ.

ථෙරවාද සම්ප්‍රදාය අනුව දෙවියන්ට පින් දීම යනුවෙන් අදහස් කෙරෙන්නේ තමන් කළ යහපත් ක්‍රියාව අනුමෝදන් කිරීම ය. දෙවියන් උදෙසා බාහිර පූජා ද්‍රව්‍ය තැබීම හින්දු ආගමික බලපෑම හේතුවෙන් බෞද්ධ සංස්කෘතියට එක් වූ විශ්වාසයකි. පාලි බණ කථාවල දෙවියන් උදෙසා පින් දීම හැර පූජා ද්‍රව්‍ය තැබීමක් දක්නට නො ලැබේ. පාලි බණ කථා අනුව භික්‍ෂූන්ගේ දෛනික ආහාර රටාව කොටස් තුනකින් යුක්ත වේ. උදෑසන කැඳත් (යාගු), ඉන් මඳ වේලාවකට පසු ව කැවිලි අනුභව කිරීම (අන්තරකජ්ජ) හා දහවල් ව්‍යඤ්ජන සහිත ආහාර අනුභවය (භෝජන) යනුවෙනි. දානය යටතේ විවිධ (ඌරු-මුව-මොණර-සා) මත්ස්‍ය මාංස පූජා කිරීම සාමාන්‍ය ජනයාගේ සිරිත ය. එහෙත් ඒ සඳහා සතුන් ඝාතනය කිරීම වෙනුවට මිළ දී ගත් මස් පූජා කර තිබේ (සද්ධාතිස්ස හා නන්දිමිත්ත වත්ථු). මාංශ අනුභවය මෙන් ම එය දානය උදෙසා පූජා කිරීමත් නිදහස් ව පැවතී චාරිත්‍රයක් බව බණ කථා මගින් තහවුරු වේ. එහෙත් එම පිළිවෙත සමාජය තුළ ප්‍රශ්නකාරී එකක් වූ බවක් ධම්මදින්න ථෙර වස්තුවෙන් පැහැදිලි වේ. කම්මසරික්කතා සංකල්පය අනුව යමින් මංශ දානය සාධාරණ බව ප්‍රත්‍යක්ෂ කිරීමෙහි ලා දරන ලද ප්‍රයත්නය සානථ වේ.

ගිහි ජනයාගේ ආගමික පිළිවෙත් අතර මල් පූජාව දිගු ඉතිහාසයක් සහිත එකකි. මල් පිදීමට පෙර මලස්න පිරිසිදු කිරීම සිදු වේ. එසේ මලස්න පිරිසිදු නො කර මල් පිදීම අකටයුතු දෙයකැ'යි සලකා ඇත (සුවණ්ණතිලාකා වත්ථු). ගිලානෝපස්ථානය බුදුරදුන්ගේ ඇගයුමට ලක් වූ චාරිත්‍රයකි. එම පිළිවෙත පාලි බණකථාවලින් ද ඉස්මතුකොට දක්වා තිබේ (රූප දේවියා වත්ථු). ලක්දිවට බෝධි ආගමනයෙන් අනතුරු ව බෝධි වන්දනය ප්‍රධාන පූජා චාරිත්‍රයක් බවට පත් ව තිබේ. පාලි බණ කථා මගින් එය විවිධ නයින් උත්කර්ෂයට නංවා ඇත (කපණාය වත්ථු). සාමාන්‍ය පොදු ජනයා අතර ඇතැම් සූත්‍ර දේශනා බෙහෙවින් ජනප්‍රිය ව පැවති බව ද තහවුරු වේ. සතිපට්ඨාන (ධම්මසුත ගාරවිලස්ස වත්ථු), ධම්මචක්කප්පවත්තන (හෙමාය වත්ථු), දේවදූත (නෙසාද වත්ථු), දක්ඛිණාවිභංග (මහාකකුධ වෙණිසාලස්ස වත්ථු/බන්ධනගාම වත්ථු) ආදි සූත්‍ර දේශනා බණ කථාවල සඳහන් වේ. ත්‍රිවිධ චෛත්‍ය පූජාවට අමතර ව උත්සවාකාරයෙන් පාත්‍රා ධාතුව පිදීමේ චාරිත්‍රයක් ද පැවති බව කඤ්චන දේවිය පිළිබඳ කථා පුවතින් පැහැදිලි වේ. ග්‍රන්ථ දෙකෙහි ම ඇතුළත් බණකථාවල ත්‍රිවිධ චෛත්‍ය අතුරින් බෝධිය හා ස්තූපය කෙරෙහි වන පුද පිළිවෙත් පමණක් ගෙනහැර දක්වන අතර, උද්දේසික චෛත්‍ය වන බුද්ධ ප්‍රතිමා වන්දනය පිළිබඳ තොරතුරු දක්නට නො ලැබේ.

පාලි බණකථා සාහිත්‍යයේ ස්ත්‍රියගේ දුර්ගුණ මෙන් ම සත්ගුණ ද එක සේ අවධාරණය කර ඇත. ඇතැම් කථාවස්තුවට ජාතකට්ඨකථාව බෙහෙවින් බලපා තිබේ. එම පිළිවෙත සහස්සවත්ථුව ද අනුගමනයකර ඇත (කාකවණ්ණතිස්ස වත්ථු). ස්ත්‍රිය පිළිබඳ පශ්චාත් බෞද්ධ දෘෂ්ටිය මෙම කථා මගින් අනාවරණය වේ.

සීහළවත්ථුව මෙන් ම සහස්සවත්ථුවේ ද දුටුගැමුණු රජ පවුල කෙරෙහි විශේෂත්වයක් දක්වා තිබේ. ඒ යටතේ කථාවස්තු නවයක් වෙන්කර ඇත. දුටුගැමුණු රජ පවුල මෙන් ම ලංකා බුදුසසන සම්බන්ධයෙන් ධර්මාශෝක අධිරාජය දෙවනපෑතිස් රජු හා නීග්‍රෝධ සමාණේරයන් වහන්සේ යන චරිත බෙහෙවින් වැදගත් වේ. එම චරිත හා සම්බන්ධ අතීත පුවත් බණකථාවල අන්තර්ගත වේ (ධම්මාසෝක වත්ථු).

සහස්සවත්ථුවේ ද මෙත් බෝසතුන් පිළිබඳ කරුණු ඇතුළත් වේ (චූලගල්ලකරට්ඨ ආසනසාලා ජග්ගන්නස්ස උපාසකස්ස වත්ථු). මෙහි දැක්වෙන පරිදි මලියදේව මහ රහතන් වහන්සේ එක්තරා උාසකයෙකු සමඟ සිළුමිණි සෑය නැමදීම පිණිස තව්තිසා දෙව්ලොවට වැඩම කළ අවස්ථාවෙහි මෙත් බෝසතුන් හා උන් වහන්සේගේ හමුව සිදු ව තිබේ. ලක්දිව සාමාන්‍ය මිනිසුන් අතර සිටි ගොපල්ලෙකු ගම් දරුවෙකු හා ගොපලු දරුවෙකු ඔවුනොවුන් විසින් සිදු කළ පුණ්‍ය කර්ම අනුව තව්තිසා දෙව්ලොව ඉපිද මෙත් බෝසතුන් පිරිවාර වාසය කරති. මෙයින් මෙත් බෝසත් චරිතය ලක්දිව සිංහල බෞද්ධ සමාජය හා සම්බන්ධකිරීමේ සහස්සවත්ථු ප්‍රයත්න විශද වේ.

සහස්සවත්ථු බණ කථා බොහෝමයක අවධාරණය කෙරෙන ප්‍රධාන සංකල්පයක් වන්නේ දානය හෝ පරිත්‍යාගය යි. භික්ෂූන් උදෙසා පිරිනැමෙන දානය පමණක් නො ව තිරිසන් සතුන් වෙනුවෙන් පිරිනැමෙන දානය ද ඉෂ්ටඵල සාධනය කෙරෙන්නේ ය යන විශ්වාසය එ මගින් තහවුරු කොට තිබේ (චූලනාග ථෙරස්ස වස්තු). මානව චින්තනය මෙන් ම චර්යා ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ දී ඇතැම් අවස්ථාවල දී සත්ව චරිත උපයෝගී කරගෙන තිබේ (ව්‍යග්සස්ස වත්ථු/චොරගෙහෙ වසිත මනුස්සස වත්ථු). මිනිසාගේ සහජාශාවන් වන ලිංගික රාගය සාදාචාර සීමා අභිබවනය කරමින් ප්‍රවාහයක් ලෙස ක්‍රියාත්මක වන අයුරු ඇතැම් බණකථාවලින් විවරණය කෙරේ (කඤ්චනදේවියා වත්ථු/මරුත්තබ්‍රාහ්මණස්ස වත්ථු/නන්දිවාණිජස්ස වත්ථු). දන් දුන් උපාසක උපාසිකාවන්ට පෙරළා ආශීර්වාද කිරීමේ පිළිවෙත මංගල සම්මත කරුණක් ලෙස සලකා තිබේ (තව පත්ථනා සමිජ්ඣන්තු මගලං වඩ්ඪෙත්වා), (ධම්මාසොක මහාරාජස්ස වත්ථු). යථෝක්ත විවරණ අනුව සීහළවත්ථුවේ මෙන් ම සහස්සවත්ථුවෙත් ඇතුළත් බණ කථාවල අන්තර්ගතයෙහි සැලකිය යුතු වෙනසක් දක්නට නො ලැබේ. මෙම ග්‍රන්ථ දෙකෙහි අරමුණ හා කාර්ය භාරය අනුව එම කෘති බොහෝදුරට එා හා සමාන ලක්ෂණවලින් යුක්ත බව පැහැදිලි වේ.

පොදුවේ මෙම ග්‍රන්ථ දෙකෙහි ම ඇතුළත් බණ කථාවල විද්‍යමාන ප්‍රධාන කරුණු දෙකක් වන දුටුගැමුණු රජ පවුල හා ස්ත්‍රීත්වය පිළිබඳ ආකල්පය විමසා බැලීම මෙම සාකච්ඡාවෙහි ලා වැදගත් වේ.

### මෙත් බුදුරදුන් හා දුටුගැමුණු රජ පවුල

ගෞතම බුදුරදුන්ගෙන් අනතුරු ව පහළවන මෛත්‍රිය බුදුරදුන් පිළිබඳ මුල් ම වාර්තාව දක්නට ලැබෙන්නේ චක්කවතිත්සීහනාද සූත්‍රයෙහි ය.[11] මිනිසුන්ගේ

ආයුෂ ක්‍රමයෙන් පිරිහී ගොස් නැවතත් වැඩීමට පටන්ගෙන අසූ වයසට පත් වූ කල්හී මෛත්‍රීය බුදුන් වහන්සේ ලෝකයෙහි පහළ වෙති (අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවේ මනුස්සෙසු මෙත්තෙය්‍යො නාම භාගවා ලොකෙ උප්පජ්ජිස්සති). එහෙත් උන් වහන්සේ පිළිබඳ වෙනත් දීර්ඝ විවරණයක් එහි අන්තර්ගත නො වේ. අනාගතයේ පහළ වන මෛත්‍රීය බුදුරදුන් පිළිබඳ විවරණයක් සපයන **අනාගතවංශයෙහි** එම බුදුරදුන්ගේ අනාගත දෙමාපියන් හා ශ්‍රාවක ශ්‍රාවිකාවන් පිළිබඳ මෙසේ දැක් වේ.

1. මාතා බ්‍රහ්මවතී නාම සුබ්‍රහ්මා නාම සො පිතා
   පුරොහිතො සංඛ රඤ්ඤො මෙත්තෙය්‍යස්ස තදා භවෙ

2. අසොකො බ්‍රහ්මදෙවො ච අග්ගා හෙස්සති සාවකා
   සීහො නාම උපට්ඨාකො උපට්ඨිස්සති තං ජිනං

4. පදුමා චෙව සුමනා ච අග්ගා හෙස්සති සාවිකා
   සුමනො චෙව සංඝො ච භවිස්සන්තග්ගුපට්ඨකා

5. යසවතී ච සංඝා ච භවිස්සන්තග්ගපට්ඨිකා
   බොධිතස්ස භගවතො නාගරුක්ඛො භවිස්සති[12]

මෙසේ මෙත් බුදුරදුන් පිළිබඳ උක්ත මූලාශ්‍රයවල ලංකාව හා සම්බන්ධ හෝ දුටුගැමුණු රජ පවුල පිළිබඳ තොරතුරු කිසිවක් ඇතුළත් නො වේ.

ලක්දිව පාලනය කළ රාජ්‍ය පාලකයන් අතුරින් සිංහල බෞද්ධ ජනයාගේ අසහාය රජු බවට පත් ව තිබෙන්නේ දුටුගැමුණු ය. ලංකාවේ ඉතිහාසය පිළිබඳ ප්‍රධාන මූලාශ්‍රය වන මහාවංශයේ පරිච්ඡේද එකොළොසක් ම වෙන් කොට ඇත්තේ දුටුගැමුණු රජු සහ ඔහුගේ ජාතික හා ආගමික කාර්යභාරය විස්තර කිරීම සඳහා ය. එහි තිස් දෙවන පරිච්ඡේදය අවසානයේ දුටුගැමුණු රජ පවුල අනාගත බුදුරදුන් හා සම්බන්ධකොට තිබේ.[13] ඒ අනුව කාවන්තිස්ස රජු හා විහාරමහා දේවිය යන දෙදෙනා මෛත්‍රිය බුදුන්වහන්සේගේ මව්පියෝ වෙති. දුටුගැමුණු හා සද්ධාතිස්ස දෙදෙනා උන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයෝ වෙති. කාවන්තිස්ස රජුගේ සොහොයුරිය හෙවත් දුටුගැමුණු රජුගේ නැන්දණිය මෛත්‍රී බුදුන්ගේ ගිහිකල භාර්යාව වේ. මෙත් බුදුරදුන්ගේ පුත්‍රයා වන්නේ සාලිය කුමරු ය.[14] මේ අනුව දුටුගැමුණු රජ පවුලේ ශාසනික සම්බන්ධතාව ගෞතම බුදුරදුන්ගේ සසුනට පමණක් නො ව අනාගත මෛත්‍රීය බුදුරදුන්ට ද සම්බන්ධකොට තිබේ. මහාවංශයේ එන මෙම විශ්වාසය පාලි බණකථා සාහිත්‍ය මගින් තවදුරටත් තීව්‍ර කරමින් කරුණු දක්වා ඇති බව එහි එන බණ කථා පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වේ.

**සීහළවත්ථුවේ** එන මෙත් බෝසත් කථාවෙහි දුටුගැමුණු හා සද්ධාතිස්ස දෙසොහොයුරන් අනාගතයේ බුදු වන මෙත් බෝසතුන් පිරිවරා තුසිත දෙව්ලොව වෙසෙන බව සඳහන් වේ. එහි දැක්වෙන පරිදි ලක්දිව රුහුණු ජනපදයෙහි කම්බොජ

ග්‍රාමයෙහි මලය නම් තෙරුන්වහන්සේ නමක් වාසය කළහ. එක් දිනෙක කම්භොජ ගමට පිඬු සිඟා වැඩි උන් වහන්සේට එක්තරා පුද්ගලයෙකු උපුල්මල් අට මිටක් පූජා කළේ ය. එම මල් අටමිට කවර තැනකට පුදම්දැ'යි කල්පනා කොට අවසානයේ තව්තිසා දෙව්ලොව පිහිටි දකුණු දළදා වහන්සේට හා සිළුමිණි සෑයට පූජා කිරීම සුදුසු යැ'යි සලකා තව්තිසා දෙව්ලොව බලා වැඩම කළහ. එහි දී උන් වහන්සේට පළමු ව ශක්‍රයා හමු වූ අතර දෙවනු ව පිළිවෙළින් ලක්දිව අනුරාධපුර නගරයේ ඇඳුම් මැසූ සන්නාලියා, හරිතාල තිස්ස දානපතියා, සද්ධාතිස්ස හා දුටුගැමුණු යන රජවරු හමුවූහ. ඔවුහු සියල්ලෝ ම තව්තිසා දෙව්ලොව වෙසෙන මෛත් බෝසතුන් පිරිවරා සිටියහ.

එම දිව්‍ය පුත්‍රයන්ට අමතර විශේෂ දෙවඟනෝ සිව් දෙනෙක් ද මෛත් බොසතුන් පිරිවරා සිටියහ. එම දෙවඟනන් සිව්දෙන අතුරින් එක් තැනැත්තියක කුඹල් දැරියක් ව සිට මිශ්‍ර පැහැති මල් පිදීමෙන් ද, එක් තැනැත්තියක මහලු ස්ත්‍රියක් ව සිට උපුල්මල් පිදීමෙන් ද, එක් තැනැත්තියක් දැරියක්ව සිට කිනිහිරියා මල් පිදීමෙන් ද, එක් තැනැත්තියක් ලුණුවිල පිදීමෙන් ද ලද ආනිසංස අනුව තව්තිසා දෙව්ලොව ඉපිද මෛත් බෝසතුන් පිරිවරා වාසය කරති. මෙසේ මේ සියල්ලන්ට ම පසු ව මලය තෙරුන් වහන්සේට මෛත් බෝසතුන් හමු විය. මෛත් බෝසතුන් හමුවෙන් අනතුරු ව මලය තෙරුන් වහන්සේ මනුලොවට වැඩම කළහ. මෙම කථාවෙහි එන පරිදි මෛත් බෝසතුන්ගේ සමීපතම පරිවාර දේව පුත්‍රයන් හා දිව්‍යාංගනාවන් බවට පත් ව ඇත්තේ ලක්දිව විසූ පුද්ගලයන් ය. ඒ අනුව මෛත් බෝසතුන් හා ලංකාව සමඟ සම්බන්ධය පාලි බණ කථා මගින් තවදුරටත් තීව්‍ර කර තිබේ.

**සීහළවත්ථුවෙහි** දුටුගැමුණු රජ පවුල කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇති බව ඒ සම්බන්ධයෙන් කථාවස්තු හතරක් වෙන් කොට තිබීමෙන් පැහැදිලි වේ. කාවන්තිස්ස රජු හා විහාර මහා දේවියගේ පෙර ආත්ම භාවයේ තොරතුරු ගෙනහැර දැක්වීමට එයින් එක් කථාවක් වෙන්කොට ඇත. හෙළදිව මලය දේශයේ බොහෝ ගවයන් හා වෙනත් චණ්ඩ මෘගයන්ගෙන් ගහන ප්‍රදේශයක් විය. එහි වාසය කළ එක් අඹුසැමි යුවළක් මුව මස් හා ගෙඩි වර්ග අනුභව කරමින් නිතර සංඝයාට දන් පිරිනැමූහ. එක් දිනක් ඔවුන් දෙපළට මලය මහදේව තෙරුන් හමු විය. උන් වහන්සේගෙන් බණ ඇසූ දෙපළ විසි අවුරුද්දක් පඤ්ච ශීලය ආරක්ෂා කළ එම දම්පතීන් දෙදෙනාගෙන් උපාසිකාව මරණින් පසු ව සමෘද්ධිමත් රජ පවුලක් වූ කැලණි තිස්ස රජුගේ දූ කුමරිය ව උපන්නා ය. ඇය විහාර දේවී නම් වූවා ය. පුරුෂයා තවත් රජ පවුලක ඉපිද කාවන්තිස්ස නමින් ප්‍රකට විය. පෙර වාසනා ඇති දෙදෙනා ම කුඩා කල සිට එකට ම වැඩුණු අතර, පසු ව ඔවුනොවුන්ගේ සහ සම්බන්ධය අනුව විවාහ වූහ. ලක්දිව රෝහණ දේශයේ රාජ්‍ය පාලකයන් බවට පත් වූ ඔවුන් දෙපළ දැහැමින් රට පාලනය කළ හෙයින් මරණින් පසු ව ස්වර්ග සම්පත් ලැබූහ. මෙම කථාවෙහි දැක්වෙන විශේෂත්වය වන්නේ කාවන්තිස්ස රජු හා විහාර මහා දේවිය කුඩා කල සිට ම එකට වාසය කිරීම යි. සාලිය කුමරු පිළිබඳ කථා පුවතින් ඔහුගේ අතීත ජන්මය අනාවරණය වේ. අතීතයේ ඔහු ලෝකුරුවෙකු වශයෙන් ඉපිද එයින්

ඉපැයූ ධනයෙන් දන් දුන් හෙයින් එහි විපාක වශයෙන් දුටු ගැමුණු රජුගේ පුත් ව ඉපිද සමෘද්ධිමත් ජීවිතයකට හිමිකම් කීවේ ය. එම කථාවෙහි ම ඔහුගේ ප්‍රියම්භිකාව වූ අශෝකමාලා පිළිබඳ ව ද තොරතුරු ඇතුළත් වේ. දුටුගැමුණු රජුගේ සොහොයුරු සද්ධාතිස්ස කුමරු ගැන කථා පුවතින් ඔහු කළ විශේෂ දානයක් ගැන තොරතුරු අනාවරණය වේ. තමන් විසින් ම මෙහෙකොට දෙන දානය උතුම් යැයි විශ්වාස කළ රජු කම්කරු වේසයෙන් ගොස් එක්තරා ගොවියෙකුගේ කොයම් කපා ලත් ධාන්‍ය විකුණා එයින් එක් භික්ෂු නමකට දන් පිරිනැමී ය. මෙම දානය ඔහුගේ මතකයේ දැඩි ලෙස රැඳී පැවති බව මරණාසන්න වේලාවෙහි එය සිහිකොට තුසිත දෙව්ලොව උපන් බව දැක්වීමෙන් පැහැදිලි වේ.

මරණාසන්න ව සිටි දුටුගැමුණු රජු පෙර තමන් විසින් සිදු කරනු ලැබූ විශේෂ දාන දෙකක් තම සිතෙහි දැඩිලෙස රැඳුණු බව ථෙරපුත්තාභය තෙරුන්ට දැන්වී ය. මෙයින් එක් දානයක් තම පියරජු විසින් ඔහු මාළිගයෙන් නෙරපූ කල්හී ඉතා දුප්පත් ව මලය දේශයෙහි වාසය කරන අවස්ථාවෙහි ද, අනෙක් දානය සද්ධාතිස්ස කුමරු හා සටන් කොට පරාජය වී මහාවන මැද අතරමං ව සිටි මොහොතෙහි පිරිනමන ලද්දකි. තමන් කළ සෙසු ශ්‍රේෂ්ඨ පින්කම් සියල්ල අභිභවා එම දාන දෙක සිතෙහි රැඳුණේ එය දුෂ්කර අවස්ථාවෙහි කළ බැවින් යැ'යි දුටුගැමුණු රජු විශ්වාස කළේ ය. **සහස්සවත්ථුවෙහි** දුටුගැමුණු රජ පවුල හා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා කථාවස්තු දහයක් වෙන්කර ඇත. කාවන්තිස්ස රජු හා විහාර මහා දේවිය පිළිබඳ මෙන් ම දුටුගැමුණු රජු හා ඔහුගේ දසමහා යෝධයන් පිළිබඳ තොරතුරු එහි ඇතුළත් වේ. **මහවංශයේ** දැක්වෙන දුටුගැමුණු රජ පවුල හා සම්බන්ධ තොරතුරු මෙම කථාවස්තුවලට පසුබිම් වී තිබේ.

මෙම කථා පුවත් සියල්ලෙන් ම සිංහල බෞද්ධයන්ගේ පරමාදර්ශී රාජ්‍ය පාලකයා වූ දුටුගැමුණු රජු හා ඔහුගේ පවුලේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු අනාවරණය වේ. ලංකා ඉතිහාසයේ වෙනත් ශ්‍රේෂ්ඨ රජෙකු හා රජ පවුලක් පිළිබඳ තොරතුරු **සීහළවත්ථුවෙන්** හෝ **සහස්සවත්ථුවෙන්** හෙළි නො වේ. එසේ ම අනාගත මෙත් බුදුරදුන් හා සම්බන්ධකොට දැක්වෙන එක ම රජ පවුල වන්නේ ද දුටුගැමුණු රජ පවුල යි. මෙම විවරණ මගින් සිංහල බෞද්ධයන්ගේ ජාතිය හා ආගම පිළිබඳ දේශපාලන දෘෂ්ටිය විශද වේ.

## පාලි බණ කථාවල දැක්වෙන ස්ත්‍රීත්ව දෘෂ්ටිය

පාලි බණ කථාවල දැක්වෙන චරිත අතුරින් බොහෝ චරිත ස්ත්‍රීන් ය. විවිධ සමාජ පන්තිවලට අයත් කාන්තාවෝ ඒ අතර වෙති. දානය හා සම්බන්ධ පාලි බණකථාවල ප්‍රධාන චරිතය කාන්තාවකි. ස්ත්‍රියගේ සාධු ගුණ මෙන් ම අසාධු ගුණ ද මෙම කථාවල අන්තර්ගත ව තිබේ. බොහෝ බණ කථාවල ස්ත්‍රීත්වය අධම කොට සලකා ඇති බව සනාථ වේ. පින් සිදු කොට ස්ත්‍රී ආත්ම භාවයෙන් මිදීමට ප්‍රාර්ථනා කළ තැනැත්තියක පිළිබඳ **සීහළවත්ථුවේ** පණස් හතරවන බණ කථාවෙහි සඳහන් වේ. ඒ අනුව දුර්භික්ෂ සමයෙහි දුකට පත් ව සිටිය දී කැඳ දානයක් පිරිනමා අනතුරු ව එක් කාන්තාවක් "මට දුගතියක් නො වේවා. දිළිඳු බවක් නො වේවා. උපනුපන්

තැන්හි ස්ත්‍රීභාවය නො ලැබේවා" යනුවෙන් ප්‍රාර්ථනා කළා ය.[15] ධනවත් කුලවතුන්ට තෙ වසරක් බැලමෙහෙවරකොට උපයාගත් ධනයෙන් දන් දුන් චන්ද්‍රා නැමැති දිළිඳු කාන්තාව සසර ඇවිදිනා තාක් ස්ත්‍රීත්වයේ නූපදීමට ප්‍රාර්ථනා කළ බව පණස් හයවන කථාවේ දැක් වේ. ස්ත්‍රීත්වය කර්ම විපාකයක ප්‍රතිඵලයක් ය යන්න පිළිගෙන ඇති බව මෙයින් ගම්‍ය වේ. මෙ වැනි අදහස් ඇතිවීමට තුඩුදුන් කරුණු පිටක ග්‍රන්ථවල ද දක්නට ලැබේ. සක්කපඤ්හ සූත්‍රයෙහි දැක්වෙන පෙර පරිදි කිඹුල්වත් පුරයෙහි විසූ තෙරුවන් කෙරෙහි පැහැදුණු ගෝපිකා නම් ස්ත්‍රියක් පිරිමි බව ප්‍රාර්ථනා කරමින් මරණින් පසු තව්තිසා දෙව්ලොව සක් දෙව් රජුගේ පුත් ව උපන්නා ය.[16] එසේ ස්ත්‍රීත්වය ප්‍රතික්ෂේප කොට පුරුෂත්වය ප්‍රාර්ථනා කිරීමට හේතුව කවරේදැ'යි පැහැදිලි කරන **සුමංගලවිලාසිනී දීඝනිකායට්ඨකථාව** පවසන්නේ ස්ත්‍රීත්වයේ සිට චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය සක්‍ර සම්පත්තිය මාරත්වය බ්‍රහ්මත්වය පසේ බුද්ධත්වය හෝ සම්මා සම්බුද්ධත්වය සාක්ෂාත් කළ නො හැකි නිසා පුරුෂත්වය ප්‍රාර්ථනා කළ බව යි. එසේ ම පුරුෂත්වය උත්තම ශ්‍රේෂ්ඨ මහත්ම තත්වයකැ'යි තවදුරටත් අවධාරණය කරයි.[17] අට්ඨකථා විවරණය අනුව ස්ත්‍රීත්වය අධම අශ්‍රේෂ්ඨ තත්වයකැ'යි නම් කර තිබේ. මේ අනුව ස්ත්‍රීත්වය අවප්‍රමාණකොට සැලකීමේ පසු කාලීන අදහස් කෙරෙහි බලපෑ ඇතැම් සාධක ආශ්‍රිත වස්තු බීජ පිටක හා අටුවා ග්‍රන්ථවල ඇතුළත්ව තිබෙන බව නිගමනය කළ හැකි ය.

**අංගුත්තර නිකායේ** චතුක්ක නිපාතයේ අපණ්ණක වග්ගයේ කම්බොජ සූත්‍රයෙහි දැක්වෙන පරිදි දිනක් බුදුරදුන් කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩවෙසෙන සමයෙහි උන් වහන්සේ හමු වන ආනන්ද තෙරණුවෝ කාන්තාව විනිශ්චය ආසනයේ නො තැබීමත්, කර්මාන්තවල නො යොදවීමත්, විදේශ කටයුතු සඳහා යොමු නො කිරීමටත් හේතු කවරේදැ'යි විමසූහ. එයට පිළිතුරු සැපයූ බුදුන් වහන්සේ කාන්තාව ස්වභාවයෙන් ම කිපෙන සුලු (කොධනො), ඊර්ෂ්‍යා කරන (ඉස්සුකී), මසුරු (මච්ඡරී), අනුවණ (දුප්පඤ්ඤා) තැනැත්තියක් ලෙස සැලකෙන හෙයින් එකී තනතුරු හා වගකීම් සඳහා ඇය නො යොදන බව පැවසූහ.[18] මේ අනුව ස්ත්‍රීත්වය අවතක්සේරු කෙරෙන අවස්ථා පිටක ග්‍රන්ථවල ද දක්නට ලැබේ. මෙහි ඇති විශේෂත්වය නම් භික්ෂුණී ශාසනය පිහිටුවීමෙහි ලා පුරෝගාමී වූ ආනන්ද හිමියන්ට බුදුරදුන් මෙසේ කරුණු දැක්වීම යි. ස්ත්‍රීත්වය පිළිබඳ බුදුරදුන්ගේ සෙසු ප්‍රකාශන හා සම්බන්ධයෙන් ගත්විට එම ප්‍රකාශන හා මෙය බෙහෙවින් විසංවාදී ස්වරූපයක් ගන්නා බව මෙහි ලා සඳහන් කිරීම අවශ්‍යය වේ. පිටකාගත මෙ වැනි සාධකවලට අමතර ව අට්ඨකථාව ස්ත්‍රීත්වය අධම කොට සලකා තිබෙන බව කරුණු පරීක්ෂා කිරීමේ දී පෙනීයයි. **අත්ථසාලිනී ධම්මසංගණී** අට්ඨකථාවෙහි එන,

"ඉමෙසු පන ද්විසු පුරිසලිංගං උත්තමං ඉත්ථිලිංගං හීනං, තස්මා පුරිසලිංගං බලව අකුසලකම්මෙන අන්තරධායති. ඉත්ථිලිංගං දුබ්බලකුසලෙන පතිට්ඨාති. ඉත්ථිලිංගං පන අන්තරධායන්තං දුබ්බල අකුසලෙන අන්තරධායති. පුරුසලිංගං බලවකුසලෙන පතිට්ඨාති. එවං උභයං අකුසලෙන අන්තරධායති කුසලෙන පතිට්ඨාතී'ති වෙදිතබ්බං"[19]

අට්ඨකතාවල එන මෙ වැනි ඉගැන්වීම ස්ත්‍රීත්වය අවතක්සේරු කිරීමේ පශ්චාත් කාලීන අදහස් ගොඩනැගීමෙහි ලා වස්තු බීජ සපයා තිබේ. **සීහළවත්ථුප්පකරණයේ** එන තිස්ස සන්නාලියාගේ කථාවෙහි ස්ත්‍රිය පිළිකුල් කොට සලකා ඇති බව මෙසේ දැක් වේ.

"මැලා ධාර්මික ව ජීවත්වන්නෙකුට අන්තරාය කරන්නියෝය., මේ ස්ත්‍රිය නම් හුලක් වැනිය. ඇලෙන ලාටුවක් වැනිය. මඩ ගොහොරුවක් වැනිය. (ශරීරයේ) ගෙඩියක් වැනිය. රෝගයක් වැනිය. දක්‍ෂ පුද්ගලයා අන්තරායකර වූ ඇය දුරු කරයි. ඇට මිනිසුන් අන්ධ කිරීමක් යයි ද ඇස් නැති කිරීමක් යයි ද අඥානයන් කිරීමක් යයි ද කියත්. ඇය නිසා ප්‍රඥාව නැති වේ. උගත් ධර්මය නො පිහිටයි., ඇඳුම් පැළඳුම් ආහාරපාන විලවුන් ආදියෙහි ස්ත්‍රීන්ගේ තෘප්තියක් නැත."[20]

මෙසේ ස්ත්‍රීත්වය අධම කොට සැලකුවත් **සීහළවත්ථුවේ** මෙන් ම **සහස්සවත්ථුවේ** එන ඇතැම් බණ කථාවල ස්ත්‍රියගේ ශ්‍රද්ධා මහිමයත් ඇය විඳි අනේකවිධ පිරිපත මෙන් ම පවුල තුළ ඇ විසින් කරන ලද කැපවීමත් මැනවින් විවරණය කොට තිබේ. ඒ අනුව සාකල්‍යයෙන් ම නරක දෘෂ්ටියකින් ඇය දෙස බලා නොමැති බව ඇතැම් කථාවස්තුවල අන්තර්ගතයට අනුව නිගමනය කළ හැකි ය. ස්ත්‍රීත්වය අකුශල කර්මයක විපාක් ය යන පශ්චාත් කාලීන පිළිගැනීම පාලි බණ කථා මගින් තවදුරටත් තහවුරු කර තිබෙන බව පැහැදිලි ය.

**සමාලෝචනය**

පොදු ජන ආගමික චින්තනය හා සමාජ සදාචාරය පෝෂණය කිරීමේ අරමුණින් රචිත පාලි බණ කථා සාහිත්‍යය ලාංකික ථෙරවාද සම්ප්‍රදායේ පශ්චාත් කාලීන වර්ධනයන් කෙරෙහි බෙහෙවින් උපස්ථම්භක වී තිබේ. ලාංකික ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායේ ව්‍යවහාරික ආගමික පදනම සැකැස්මෙහි ලා පාලි බණ කථා සාහිත්‍යයට අයත්, **සීහළවත්ථුව** හා **සහස්සවත්ථුව** මූලාශ්‍රය වූ බව පෙනේ. එම කෘති ද්වය මගින් අභිනව ආගමික වත්පිළිවෙත් හා පුදපූජා චාරිත්‍ර රැසක් ලංකා ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායට හඳුන්වා දී තිබේ. සිංහල රාජාවලියේ අසහාය රාජ්‍යපාලකයා වශයෙන් **මහාවංශයෙන්** උත්කර්ෂයට නංවන ලද දුටුගැමුණු රජ පවුල අනාගතයේ පහළ වන මෛත්‍රීය බුදුරදුන් හා සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය මෙම ග්‍රන්ථ දෙක මගින් තව දුරටත් ශක්තිමත් කොට වර්ධනය කර තිබේ. සිංහල ජාතිය හා බුදු සසුන අතර සම්බන්ධය පිළිබඳ සිංහල බෞද්ධ සමාජ දෘෂ්ටිය එ මගින් විශද වේ. ස්ත්‍රිය පිළිබඳ පශ්චාත් බෞද්ධ දෘෂ්ටිය හා සම්බන්ධ ඇතැම් පිළිගැනීම්වල වෙනස් ආකාරයේ වර්ධනයක් පාලි බණ කථාවල විද්‍යමාන ය. ඒ අනුව ස්ත්‍රීත්වය අකුශල කර්මයක ප්‍රතිඵලයක් ය යන පාලි බණකථා මගින් ඉදිරිපත් කෙරෙන මතය කර්මය පිළිබඳ මුල් බුදුසමයේ ඉගැන්වීමට ඉඳුරා ම ප්‍රතිවිරුද්ධ ය. මේ අනුව පාලි බණ කථා මගින් ඉදිරිපත් කෙරෙන ස්ත්‍රිය පිළිබඳ සමාජ දෘෂ්ටිය සාකල්‍යයෙන් ම ගතානුගතික හා සම්ප්‍රදායනුකූල වූවක් වන අතර, එය ප්‍රගතිශීලි සමාජ දෘෂ්ටියෙන් බොහෝ දූරස්ථ ව පවතින්නකැ'යි නිගමනය කළ හැකි ය.

## ආන්තික සටහන්

1 සීහළවත්ථුප්පකරණ, 40- 42.

2 වැලිවලින් ස්තූපයක් කොට එයට වන්දනාමන කළ පුවතක් සීහළවත්‍ථුප්පකරණයේ එන බුද්දක තිස්ස තෙරුන්ගේ කථාවෙහි දැක් වේ. පෙර භවයක ගොපල්ලෙකු ව උපන් බුද්දක තිස්ස තෙරුන් වහන්සේ වැලිවලින් චෛත්‍යයක් නිමවා නොයෙක් වන මල් එක්කොට එයට පුදා උණකිලිල්වලින් කොඩි සාදා බට ලී නලාවක් පිඹ තමාගේ බඩ බෙරයක් මෙන් සිතා වාදනය කොට ස්තූප වන්දනාව සිදු කළහ.

3 **සීහළවත්‍ථුප්පකරණය**, 149

4 **සීහළවත්‍ථුප්පකරණය**, 141

5 **සීහළවත්‍ථුප්පකරණය** 65

6 **සීහළවත්‍ථුප්පකරණ** 59

7 සීහළවත්ථුවේ සිංහල අනුවාදයː ඉතා පැරණි සිංහල බණ කථා, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2002.

8 ඒකස ඔැංඑ්දජසඑහ නැමරබ්කල ෑාඨ ඔගළග ඝයහි ඃඩසිල බදබාදබල 1886ල 41-50

9 **සහස්සවත්‍ථු**, ංස

10 **රසවාහිනි**, 1.

11 **දී.නි** 3 (බු.ජ.මු. 1976) 130.

12 ඒකස ඔැංඑ්දජසඑහ නැමරබ්කල ෑාඨ ඔගළග ඝයහි ඃඩසිල බදබාදබල 1886ල 50ග

13 **මහාවංස පරිː** 32

14 **සීහළවත්‍ථුප්පකරණ**, 144.

15 මා දුග්ගති මා ච දාළිද්දභාවො -ඉත්ථි භාවො ච භවාභවෙසු

16 **දීඝනිකාය 2** (බු.ජ.මු 1976) 406.

17 **සුමංගලවිලාසිනී 2** (හේ.වි.මු., 1918), 504.

18 **අංගුත්තර** 4 (බු.ජ.මු) 156.

19 **අත්‍ථසාලිනී** (හේ.වි.මු., 1940) 278.

20 **සීහළවත්‍ථුප්පකරණ**, 1-2

ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය

අංගුත්තර 4 (බු.ජ.මු ) කොළඹː 1956.

අත්‍ථසාලිනී (හේ.වි.මු.) කොළඹː 1940.

දීඝනිකාය 2 (බු.ජ.මු ) කොළඹː 1976.

මහාවංස 1, 2, 3 වෙළුම. (නව සංස්.) චන්ද්‍රාවික්‍රමගමගේ. නුගේගොඩː බෞද්ධ සංස්කෘතික

මධ්‍යස්ථානය, 2015.

රසවාහිනි, (සංස්ː) රංජිත් වනරත්න, සමයවර්ධන, 2004.

සුමංගලවිලාසිනී 2 (හේ.වි.මු.) කොළඹ: 1918.

සීහළවත්ථුප්පකරණ, (සංස: ) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, අනුල මුද්‍රණාලය, කොළඹ: 1959.

සහස්සවත්ථුප්පකරණ, (සංස:) පොල්වත්තේ බුද්ධදත්තහිමි, එස්. ගොඩගේ, කොළඹ: 2008.

Pali Text Society Journal, Ed: T.W. Rhys Davids, London, 1886.